පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 11 |

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- **ක්‍රිස්තියානි ධර්මය**

පාසලේ නම : ..............................................................................

ඇතුළත්වීමේ අංකය : ...........................

කාලය : පැය 03

<u>උපදෙස් :</u>

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගන්න.**

01. ළදරු ඝාතනය ගැන දිවැසි වැකි පැවසූ දිවැසිවරයා වන්නේ,
i) යොසායා ය ii) ජොවෙල් ය iii) ජෙරමියා ය iv) මීකා ය

02. නැති වූ පුත්‍රයාගේ කථාවේ අප විශේෂයෙන් ඉස්මතු කළයුතු වන්නේ,
i) කීකරුව ජීවත්වීමේ වැදගත්කම ය.
ii) පරාර්ථකාමීව ජීවත්වීමේ වැදගත්කම ය.
iii) මිතුරු ඇසුරින් තොරවීමේ වැදගත්කම ය
iv) අසීමිත දේව ප්‍රේමය තේරුම් ගැනීමේ වැදගත්කම ය.

03. ලූක් සුභසුනට අනුව ජේසුස් වහන්සේට පැමිණි තුන්වෙනි පරීක්ෂාව අද තදින් ක්‍රියාත්මක වන්නේ,
i) දේව බලය පිළිබඳව සැක කරන කිතුණුවන් තුළිනි.
ii) දේව වචනය නොකියවන කිතුණුවන් තුළිනි.
iii) ලෞකිකත්වයටම යොමු වූ කිතුණුවන් තුළිනි.
iv) හාස්කම පසුපසම දුවන කිතුණුවන් තුළිනි.

04. ''ගැළවීම මාගේ දෙනෙතින් දිටිමි' යයි කියමින් ජේසු බිළිඳා මෙසියස් බව මුලින්ම හඳුනාගත් පුද්ගලයා වන්නේ,
i) ස්නාවක ජොහාන්තුමා ii) මරියතුමිය iii) සිමියොන් iv) ආනා

05. ක්‍රියා පොතට අනුව පාවුල්ට අකිලා හා ප්‍රිස්කිලා හමුවන්නේ,
i) ඇතැන්ස් නුවරදී ii) කොරින්තියේදී iii) එපිසයේ දී iv) පිලිප්පියේ දී

06. වර්තමාන කිතුණු පවුලක කාලීන වගකීම විය යුත්තේ විශේෂයෙන්ම,
i) සෙසු පවුල් අභිබවා මුදල් ඉපයීමට වෙහෙසවීම ය.
ii) සමාජ අපචාරයන්ට ගොදුරු නොවීමට සිතා ගැනීම ය.
iii) පවුල තුළ හා පිටත ද ප්‍රේමනීය පිළිගැනීමෙන් යුතුව ක්‍රියාකිරීම යි.
iv) නෑදෑ පිරිස පමණක් ආශ්‍රය කිරීම යි.

07. ආබ්‍රහම් දේව කැඳවීමට නොපැකිළ දැක් වූ ප්‍රතිචාරය කිතුණුවන්ට මඟ පෙන්වන්නේ,
i) දේව කැඳවීම සුළුකොට සැලකිය යුතු නැති බව ය.
ii) දේව කැඳවීමට යහපත් ප්‍රතිචාර දැක්වීමේ දී අප සතු ආශාවන් පරිත්‍යාග කළයුතු බව ය.
iii) දේව කැඳවීමට කිකරුවීමේ දී, පරීක්ෂාකාරීව තීරණ ගත යුතු බව ය.
iv) දේව කැඳවීමට අවනත වීමේ දී අචල ඇදහිල්ලෙන් උන්වහන්සේගේ අරමුණු ඉටු කිරීමට යටත් විය බව ය.

08. දිව්‍ය එඬේරාණෝ තම බැටළුවන් අතර පවතින සුහද සබැඳියාව මින් ගම්‍ය වන්නේ,
i) බැටළුවන්ගෙන් කායික අවශ්‍යතා සැපයීම නිසා ය.
ii) බැටළුවන්ගේ ජීවිත සතුරු ප්‍රහාරයන්ගෙන් සුරැකීම නිසා ය.
iii) එඬේරාණන්ගේ මඟපෙන්වීම අනුව බැටළුවන් ක්‍රියාකාරී වීම නිසා ය.
iv) දෙපාර්ශවය අතර නිරන්තර සන්නිවේදන පැවතීම නිසා ය.

09. ජෝබ්ගේ ආදර්ශය අනුව දරාගත නොහැකි පීඩා හමුවෙහි නොසැලී සිටීමට අත්‍යාවශ්‍ය ක්‍රියාමාර්ගය වන්නේ,,

i) දේව ගරුබිය පාමින් සියලුම දේව ආඥා රක්ෂා කිරීම ය.
ii) පෙළඹවීම මත වඩා බලවත් දෙවිවරුන්ගේ සරණ පැතීම ය.
iii) දේව ඇදහිල්ලේ ස්ථාවරය මත විශ්වාසවන්තව කීකරුවීම ය.
iv) පීඩා ගිනිදැල් නිවී යනතුරු සිත එකඟ කරගෙන යාච්ඤා කිරීම ය.

10. දේව පණිවිඩය එළිදරව් කිරීමෙන් මරණ මංචකය හිමි වූ දිවැසිවර ජෙරමියාගෙන් අද අප ලබන මඟපෙන්වීම වන්නේ,

i) සේවය තුළ දුක් පීඩා ඉවසිල්ලෙන් දරා ගැනීමේදී දෙවිඳුන් සුදුසු ලෙස ක්‍රියා කරන බව යි.
ii) පීඩා හමුවෙහි බලාපොරොත්තුවෙන් යාච්ඤාවේ යෙදිය යුතු බවයි.
iii) දුක් වේදනා දරුණු වූ විට දෙවිඳුන්ගෙන් ඊට හේතු විමසිය යුතු බව යි.
iv) දුක් විඳි සේවකයා ගැන මෙනෙහි කරමින් තමාගේ මිදීම ගැන යැදිය යුතු බව යි.

11. ලෝකාරම්භයේදී ම ප්‍රේමයේ අසීමිතය විදහා පෑ මැවුම්කාර දෙවියන් වහන්සේගෙන් මැවිල්ලේ උතුම් මල්කඩ සම්බන්ධතා පළුදු කර ගත්තේ,

i) අකීකරුකම නිසා ය.
ii) තෘෂ්ණාව නිසා ය.
iii) ආත්මාර්ථකාමය නිසා ය.
iv) අහංකාරය නිසා ය.

මින් ගැළපෙන පිළිතුර වන්නේ,

i) i හා iii ය. ii) i හා ii ය. iii) ii හා iv ය. iv) i හා iv ය.

12. කිතුණු ප්‍රේමයේ පදනම මත, ස්ථිර ලෙස පූර්ණත්වය අත්විඳීමට අත්‍යාවශ්‍ය වන්නේ,

i) දුෂ්කර දෙයක් වුව ද දස පණත අකුරටම පිළිපැදීම ය.
ii) දෙවිඳුන්ගෙන් භුක්ති විඳි නිමකළ නොහැකි ආශිර්වාද ගැන සාක්ෂි දැරීම ය.
iii) නිරන්තර යැදුමෙන්, අචල ඇදහිල්ලෙන් ප්‍රේමයේ ප්‍රතිපත්ති අනුව දිවි ගෙවීම ය.
iv) සියලු භේද අභිබවා දුර්වලයන් වෙනුවෙන් ජීවිතය වැය කිරීම ය.

13. අප මවුබිමේ සියලුම කිතුණු සභා එකමුතුව මැදිහත් විය යුතු බව එඩිතරව පෙන්වා දුන්නේ,

i) අතිගරු ලක්ෂ්මන් වික්‍රමසිංහ පියතුමා ය.
ii) සෝමසිරි කේ පෙරේරා දේවගැතිතුමා ය.
iii) පීටර් ජෙරාඩ් සිල්වා දේවගැති තුමා ය.
iv) ගරු මයිකල් ලැප්ස්ලි පියතුමා ය.

14. අප දේශය තුළ පවතින වෛරය හා මිථ්‍යාවබෝධය නිවාලීමට ගරු තිස්ස බාලසූරිය පියතුමා තම ලේඛන මඟින් ඉදිරිපත් කළ යෝජනා වූයේ,

i) විරෝධවාදීන්ගේ අවශ්‍යතාවන්ට ඇහුම්කන් දීමට ය.
ii) පීඩා විඳිනවුන්ගේ යෝජනා ගැන සලකා බැලීමට ය.
iii) සතුරන්ට සමාව දීම හා ප්‍රේම කිරීමට ය.
iv) හඬ නඟන පාර්ශවයේ දුක් ගැනවිලි ගැන සොයා බැලීමට ය.

15. කිතුණු ජීවිතේ සදහටම පවතින ධර්මතා වන්නේ,

i) ඉවසීම, ඇදහිල්ල හා ප්‍රේමය වේ.
ii) බලාපොරොත්තුව, ඉවසීම හා ඇදහිල්ල ය.
iii) ඇදහිල්ල, බලාපොරොත්තුව හා ප්‍රේමය ය.
iv) කරුණාව, දයානුකම්පාව හා පරාර්ථකාමීත්වය

16. ශුභාරංචිය තුළ වාර්තා වී ඇති මනුෂ්‍ය පුත්‍රයාණන් හා සම්බන්ධ ජේසුස් වහන්සේ වදාළ උපමා තුන නම්,

i) යහපත් බැටළු එඬේර, මිදිවැල, මිදිවත්ත හා ගොවීන් ය.
ii) එල නැති අත්තික්කා ගස, නැති වූ බැටළුවා, ජාතීන්ගේ විනිශ්චය දවස
iii) මිදිවැල, යහපත් බැටළු එඬේරා, ජාතීන්ගේ විනිශ්චය දවස
iv) ජීවනදායක භෝජනය, ඒකත්වයේ යාච්ඤාව, නැති වූ පුත්‍රයා

17. ගැළවුම්කාරයාණෝ කුරුසිය මත දී යැදුමකින් දුන් ආදර්ශය දෙවන ජුවාම් පාවුලු පාප්තුමා මුළු ලොවට ප්‍රදර්ශනය කළේ,
   i) තම මිනීමරුවාට කොන්දේසි සහිතව කමාව දීම ය.
   ii) තම සතුරා උපදේශනය මඟින් පාපොච්චාරණයට යොමු කිරීමෙනි.
   iii) තම මිනීමරුවාගේ පාමුලට ගොස් ඔහුට කමාව දීමෙනි.
   iv) මරණීය දණ්ඩන නීතිය අවලංගු කිරීමට ඉල්ලා සිටීමෙනි.

18. නූතන සමාජයේ ජීවත් වන කිතුණුවන්ට එහි තරඟකාරී ස්වභාවය මඟහරවා ගැනීමට ගතහැකි වැදගත්ම පියවර වන්නේ,
   A. පොදු යහපත උදෙසා සිදුකරන සේවාවන්ට අතහිත දීම ය.
   B. සෑම තරඟකාරී ක්ෂේත්‍රයන්ගෙන්ම ඉවත්වීමෙන් ය.
   C. සේවයට වඩාත් නැඹුරු ජීවන වෘත්තියක් තෝරා ගැනීම ය.
   D. තරඟවල සාධාරණත්වය රැක ගැනීමට පෙරමුණ ගැනීම ය.
   මින් වඩාත් ගැළපෙන පිළිතුර වන්නේ,
   i) A, B ය. ii) B, C ය. iii) C, D ය. iv) A, C ය.

19. සැබෑ මිදිවැලට ඒකාබද්ධ වී එල දරන කිතුණු බැතිමතුන්ගේ ජීවිතවලින් එළි දැක්වෙන ලක්ෂණයකි.
   i) සාමාජිකත්වය දරන කිතුණු සභාවේ ක්‍රියාකාරී අවයවයන් වීම.
   ii) අඳුරු ලොවක දීප්තිමත් තාරකා මෙන් ආලෝකය විහිදුවාලීම.
   iii) වාද භේද අභිබවා අසල්වැසි ප්‍රේමය ක්‍රියාත්මක කිරීම.
   iv) දේව සේවකයන්ගේ අවශ්‍යතා සපුරාලීමට වැයවීම.

20. උත්තම පූජක යාච්ඤාවේ '' එකම සැබෑ දෙවියන් වහන්සේ වන ඔබ ද, ඔබ විසින් එවන ලද ජේසුස් වහන්සේ ද දැන ගැනීම ය'' යන ප්‍රකාශනය
   i) ශුද්ධාත්මයාණන් හා සම්බන්ධය ii) කිතුණු ඇදහිලි ප්‍රකාශය හා සම්බන්ධය
   iii) උත්ථානය හා සම්බන්ධය iv) සදාතන ජීවිතය හා සම්බන්ධය

21. ක්‍රිස්තුස් වහන්සේ සිය ශ්‍රාවකයන් ඉදිරියේ කළ යැදුමෙහි ඉතා සංක්ෂිප්තව ''සත්‍යය'' විග්‍රහ කළේ,
   i) කන්ද උඩ දේශනාවේ ආශිර්වාද වාක්‍යය ලෙස ය.
   ii) ක්‍රිස්තුස් වහන්සේ දුන් ප්‍රේමයේ නව ආඥාව ලෙස ය.
   iii) දෙවියන් වහන්සේගේ නව ධර්මය ලෙස ය.
   iv) පුනර්ජීවනයේ උරුමය ලෙස ය.

22. විවිධ කිතුණු සභා නිකායන් එකමුතු කිරීමේ ව්‍යායාමය සාර්ථක වීම හේතුකොට ගෙන,
   i) විවිධ නිකායික නායකයන් අතර සුහදතාවය හා සමගිය වර්ධනය වේ.
   ii) පරාර්ථකාමීව විවිධත්වය තුළින් ඒකත්වය කරා ළඟාවිය හැකි වේ.
   iii) රැළට අයත් නොවූ අන් බැටළුවෝ සත්‍ය පිළිගෙන ඇදහීමට යොමු වේ.
   iv) පොළොවේ සීමාන්තය කරා ප්‍රබල එකමුතු සාක්ෂිකාර සේනාවක් බිහි වේ.

23. ශුද්ධාත්ම බලයෙන් සන්නද්ධ වූ මුල් සභාව විශේෂ අවධානය යොමුකළේ,
   i) තම ආර්ථික සැලසුම ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීමට ය.
   ii) ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානයට නිර්භීතව සාක්ෂි දැරීමට ය.
   iii) ග්‍රීක බස කථා කළ යුදෙව් වැන්දඹුවන්ට සාධාරණ ලෙස අවශ්‍යතා සපුරාලීමට ය.
   iv) රෝගීන් හා පීඩිත වූවන්ට සුව සහනය ලබාදීමට ය.

24. නව ගිවිසුමේ සඳහන් වන තරාතිරම් නොබලන දෙවියන් වහන්සේ ජාතීන් හට සාධාරණය හෙළිදරව් කළ අවස්ථාවකි.
   i) යුදෙව් පෙන්තකොස්ත මංගල්‍යය දින ශුද්ධාත්ම බලයෙන් ශ්‍රාවකයන් විවිධ භාෂාවලින් කථා කිරීම.
   ii) පේදුරුතුමා නිර්භීතව ප්‍රථම දේශනය සිදුකිරීම.
   iii) කොරනේලියස්ගේ නිවසේ පේදුරුතුමා ශුභාරංචිය දේශනා කිරීම.
   iv) උපස්ථායක පිලිප්තුමා සමාජයේ ශුභාරංචිය දේශනා කිරීම.

25. දෙවිඳුන්ගේ අසීමිත ප්‍රේමයෙන් මානව වර්ගයාට ගැළවීම උරුම කරගත හැකි බව තීරණය වූයේ,
 i) අන්තියෝකියේ මිශ්‍ර සභාවේදී ය.
 ii) රෝම අධිරාජ්‍යයේ සීසර්ගේ විනිශ්චය සභාවේ දී ය.
 iii) ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය වූ සැන්හෙඩ්‍රික් සභාවේ දී ය.
 iv) ජෙරුසලමෙහි පැවති මන්ත්‍රණ සභාවේ දී ය.

26. සමාජයේ ද්වේශයට ලක්ව සිටි සමාරික ස්ත්‍රිය දයානුකම්පාවෙන් පිළිගැනීම තුළ ජේසුස් වහන්සේ විදහා පෑවේ,
 i) දේව ස්වරූපය ලත් අන්‍යජාතික කාන්තාවකගේ විවෘත භාවයයි.
 ii) ජුදෙව්වන්ට පමණක් සීමිත බව සිතූ දේව දරුකමේ උරුමය යි.
 iii) සියලුම තහංචි අභිබවා යන දේව රාජ්‍යයේ ක්‍රියාකාරී ප්‍රේමය යි.
 iv) කාන්තාවන්ට දේව රාජ්‍යය තුළ වූ පිළිගැනීම යි.

27. අප ජීවිත තුළ දේව සම්බන්ධතාවය ශක්තිමත් කරගත් විට අත්විඳිය හැකි ජයාන්විත සාක්ෂියට ජීවමාන නිදසුනක් වන්නේ,
 i) ස්තේපන් තුමාගේ වේද සාක්ෂික ඝාතනය යි.
 ii) ස්තේපන් තුමා දර්ශනය කළ ස්වර්ගික තේජශ්‍රීය යි.
 iii) ස්තේපන් තුමා තමාට ගල් පහර දුන් සතුරන්ට දුන් කමාවයි.
 iv) ස්තේපන් තුමා අවසාන හුස්ම හෙළමින් තම ආත්මය සමිඳුන්ට භාරදීම ය.

28. මුල් සභාව මෙසියානු මෙහෙවර ක්‍රියාත්මක කිරීමේ දී පරිපාලනය සම්බන්ධයෙන් ගත් පියවර තුළ වර්තමාන ශුද්ධ සභාවට ගතහැකි ආදර්ශයක් වන්නේ,
 i) ශුද්ධාත්මයාණන්ට ප්‍රාතිහාර්යයන් කිරීමට ඉඩහැරීම ය.
 ii) ශුභාරංචිය ව්‍යාප්තියට ප්‍රමුඛත්වය දී සන්සුන්ව ගැටලු විසඳීම ය.
 iii) ඇති හැකි අය සභාවේ වර්ධනයට අතදීම ය.
 iv) බැතිමතුන්ගේ දීමනා හඳුනාගෙන ඒවා වැඩිදියුණු කරගැනීමට බලය විමධ්‍යගත කිරීම ය.

29. ''ක්‍රිස්තියානිය'' ද්වේශ කළ සාවුල් දෙවිඳුන්ගේ දෑත් තුළ ප්‍රබල ආයුධයක් බවට පත් වූයේ,
 i) උත්ථාන වූ ජීවමාන ජේසුස් වහන්සේගේ හඬට කීකරුවීමෙනි.
 ii) කිතුණුවන්ට කළ දරුණු පීඩන ගැන තෙදිනක් මනස්ථාපනය වීමෙනි.
 iii) ස්තේපන්ගේ අවසානය දෙනෙතින් දර්ශනය වීමෙනි.
 iv) උත්තම පූජක අවසරය ඇතිව දමස්කයට යන විට සිය කැමැත්තෙන් තීරණය වෙනස් කිරීමෙනි.

30. ජුදෙව් විජාතික මිශ්‍ර සභාව අවංකව උපවාසයෙන් ශුද්ධාත්ම පිහිට යැදුවේ,
 i) නොදැමුණු ජනතාවක් සමිඳුන්ගේ මාර්ගයට යොමු කිරීමට ය.
 ii) ක්‍රිස්තු අණපරිදි ශුභාරංචි සැලසුමට දායක වීමට ය.
 iii) ශුභාරංචියේ ජීවමාන පණිවිඩය අන් අයට පිළිගැන්වීමට තිබූ අධිෂ්ඨානය ය.
 iv) මුල් සභාවේ ආදර්ශය අනුව වර්ධනය වීමට ය.

31. පහත සඳහන් ඒවා අතරින් බාර්ණබස් හා සාවුල් අභියෝග හමුවෙහි හවුල් නායකත්වයේ සේවයට ආදර්ශයක් වන්නේ,
 i) ජුදෙව් ගල් ගැසීමේ කුමන්ත්‍රණය දැනගත් විට මඟහැර යාම
 ii) ප්‍රාතිහාර්යයන් මඟින් ජනතාව ඇදහීමට යොමුකිරීම
 iii) දැඩි විරෝධය හමුවෙහි නොසැලී ශුභ අස්නට සාක්ෂි දැරීම
 iv) දේව වරප්‍රසාද තුළ බොහෝ කලක් නැවතී දූත සේවය උදෙසා ඉදිරියට යාම

 i) iii හා iv ය. ii) ii හා iv ය. iii) i හා iv ය. iv) i හා iii ය.

32. ලුස්ත්‍රාවේ ජනතාව සාවුල් හා බාර්ණබස්ට දෙවිවරුන්ගේ නම් දුන්නේ,
 i) මව්කුස පටන් කොරව සිටි මිනිසා නැගිට සිටි බව දුටු නිසා ය.
 ii) සාවුල් සුවය වෙනුවෙන් මහ හඬින් කී වචන අසා ජනතාව මවිත වූ නිසා ය.
 iii) බහුදේව වාදයට ඇබ්බැහි වූවන් දෙවිවරුන්ගේ ආශ්චර්යවත් ක්‍රියා පැතූ නිසා ය.
 iv) මිනිස් වෙසින් පතිත වී දෙවිවරු ක්‍රියාකරන බව ජනතාව පිළිගත් නිසා ය.

33. පහත සඳහන් ඒවා අතුරින් පිලිප්පියේ දී පාවුල් හා සීලස් තම රෝම පුරවැසිභාවය හෙළි නොකළ හා හෙළි කළ අවස්ථාව වූයේ,

i) ඇඳුම් ගළවා දැඩි ලෙස පහර දී සිරගත කළ අවස්ථාවේ දී
ii) නඩුකාරයන් ඉදිරියෙහි බොරු චෝදනා ඉදිරිපත් වූ අවස්ථාවේ
iii) සමාදානයෙන් සිරගෙදරින් යන්නට දැක් වූ අවස්ථාවේ දී
iv) ඇතුලු සිරගෙයි දමා පාද දඬු කඳන්වල දැමූ අවස්ථාවේ දී

i) i, ii, iv හා iii ය. ii) i, iii, iv හා ii ය.
iii i, iii, iv හා ii ය. iv) i, ii, iii හා iv ය.

34. ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් සත්‍යතා අවබෝධ කරගෙන මුළු සිතින් ධර්ම දූතයන්ගේ ඉගැන්වීම් පිළිගෙන අදහාගත් ජනයා ජීවත්වූයේ කොහේ ද?

i) පිලිප්පියේ ii) තෙසලෝනිකයේ iii) බෙරියේ iv) ඇතැන්ස්හි

35. ''උන් වහන්සේ අපි එකිනෙකාට නුදුරුව සිටින සේක'' මෙම ප්‍රකාශනය කළේ කුමන අවස්ථාවක ද?

i) ඇතැන්ස් නුවර අරියෝපග ශාලාවේ දේශනය කළ අවස්ථාවේ
ii) ඇතැන්ස් නුවර වෙළඳාම්පොළේ දී ජුදෙව්වරු හා වාද කළ අවස්ථාවේ
iii) ඇතැන්ස් නුවර ස්තොයික හා එපිකූරිය දාර්ශනිකයන් හා කතා බහ කළ අවස්ථාවේ දී
iv) ඇතැන්ස් නුවර ජනතාව ''මේ වාචාලයා කුමක් කියන්නට හදනවාදැ යි'' ප්‍රකාශිත අවස්ථාවේ දී

36. ජනතාවගේ හදවත් තුළ සමිඳුන්ගේ ''හරි මාර්ගය'' නිදන්ගත කිරීමට බාධා කරමින් නපුරු බලවේග එල්ල කරන ප්‍රහාර බිඳ හෙළීමට ක්‍රියාකළ හැක්කේ කෙසේ ද?

i) ඇදහිල්ලෙන් ශුද්ධාත්ම මඟපෙන්වීමට විවෘත වීමෙනි.
ii) නපුරු බලවේග මඟහැර ඉදිරි පියවරට යොමුවීමෙනි.
iii) විනාශකාරී ක්‍රියාදාමයන්ට අනතුරු ඇඟවීමෙනි.
iv) සත්‍ය වසන් කිරීමේ තිත්තකම පෙන්වා දීමෙනි.

37. අඳුරු ලොවක දිවිගෙවන ජනතාවට ශුභාරංචිය පිළිගැන්වීමට අවස්ථාව විවර වන්නේ,

i) අඳුරේ දිවිගෙවන ජනතාව දුටු ආශ්චර්යය නිසා ඇති වූ මවිතය හේතුකොට ගෙන ය.
ii) දුබලයන් ගැලවීමට ශුභාරංචි පණිවිඩයේ ඇත්තා වූ දිව්‍ය බලය හේතුකොට ගෙන ය.
iii) ජනතාව මිනිස් වෙස්ගත් දෙවිවරු නැමදීමට උත්සුක වීම හේතුකොට ගෙන ය.
iv) දුර්වලයන්ගේ විශ්වාසය හා බලාපොරොත්තුව හේතුකොට ගෙන ය.

38. ඇදහිල්ලෙන් ''නව ජීවිත'' හැරීම අත්විඳින බැතිතුමන් කැපවී වැය වන්නේ,

i) පරාර්ථකාමී දුබලයන්, ප්‍රබලයන් කිරීමේ උත්සාහයට දායක වීමට ය.
ii) තමා සාමාජිකත්වය දරන ''නිදිබර'' සභාවෙන් ''පිබිදෙන'' සභාවකට මාරු වීමට ය.
iii) කිතුණු ශාසනය උදෙසා දිවි පරදුවට තබා ජීවිතාන්තය දක්වා සත්‍යතාවයේ සාක්ෂියට පංගුකාරයන් වීමට ය.
iv) නව කිතුණු සභාවක් පිහිටුවා එහි නායකත්වය දැරීමට කටයුතු කිරීමට ය.

39. අනාගතයේ තීරණ ගැනීමට අවස්ථාව එළඹුණු විට කිතුණු දරුවෙකු ලෙස වඩා එලදායී වන්නේ,

i) දේව සැලසුමට අනුව නිහතමානීව අවනත විට ය.
ii) නිරන්තර යැදුමෙන් තම තීරණය සලකා බැලීමට කන්නලව් කිරීම ය.
iii) ක්‍රිස්තු ආදර්ශය මෙනෙහි කරමින් තම ආත්ම විශ්වාසය මත රැඳී සිටීම ය.
iv) තීරණ අභිමුවෙහි තමාට හිමිවන යස අයස තක්සේරු කිරීම ය.

40. ''මම දෙවියන් වහන්සේ විශ්වාස කරමි. මට කී ලෙසම සිද්ධ වන්නේ යයි විශ්වාස කරමි'' මෙම විශ්වාසනීය ප්‍රකාශනය කළ හැක්කේ,

i) ඒක දේව වාද ඇදහිල්ල තුළ ජීවත්වන අයට ය.
ii) සේවයට පූර්ණකාලීනව කැප වී සිටින සේවකයන්ට ය.
iii) ඇදහිල්ලේ ප්‍රබල පදනම මත නව ජීවිත උපත අත්විඳි බැතිමතුන්ට ය.
iv) දෙවිඳුන්ට කළ නොහැකි කිසිවක් නැත කියා ප්‍රසිද්ධියේ සාක්ෂි දැරූ අයට ය.

(ලකුණු 1 x 40 = 40)

## ක්‍රිස්තියානි ධර්මය II කොටස

❖ **පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.**

01. i) ආබ්‍රම් ලැබූ නාමයේ අර්ථය ලියන්න.

ii) අවිහිංසාවාදීව පරාර්ථකාමීව ජීවිතය පරදුවට තැබූ අපේ කාලයේ එඬේරවරුන් දෙදෙනෙකු නම් කරන්න.

iii) පැරණි ගිවිසුමේ සඳහන් ජෝබ් වාර්තාව කියවීමෙන් ඔබ ලත් මගපෙන්වීම කුමක් ද?

iv) ''මේ ඔබ සමග කතාකරන මම ඒ තැනැත්තා වෙමි'' මෙහි ඔබ හා මම ලෙස සඳහන් වන්නේ කවුරුන් ද?

v) යුදෙව් ජනතාව මුදල් වර්ග දෙකකින් ගෙවූ බදු වර්ග මොනවා ද?

vi) යුදෙව් පෙන්තකොස්ත මංගල්‍යය දිනයේ දී උඩුමහලේ රැස් වූ ශ්‍රාවක පිරිසට ඇසුණු හා දැනුණු මවිතකර සංකේත දෙක කවරේ ද?

vii) පිහිට විය යුත්තන් නගා සිටුවීමට මුල් සභාව ක්‍රියාත්මක කළ පියවර දෙකක් ලියන්න.

viii) සම්පූර්ණ කරන්න.

ආත්මයන් වහන්සේගේ ....................... ඇතිව හැසිරෙන්න.

එවිට ඔබ මාංශික ....................... වසග....................... නැත.

මන්ද ....................... තෘෂ්ණාවන් ආත්මයන් වහන්සේට විරුද්ධ ය.

ix) සාවුල් ජෙරුසලමේ දියත් කළ පීඩාව කරුණු දෙකකින් ලියන්න.

x) ''නුඹලාගේ ගීත ඝෝෂා නතර කරන්න. නුඹලාගේ වීණා නාදයට සවන් නොදෙමි.'' මෙම දිවැසි වදන ප්‍රකාශ කළ දිවැසිවරයා හා එයට සම්බන්ධ ජන කොටස නම් කරන්න.

(10 x 2 = 20)

02. i) සමිඳාණෝ බලාපොරොත්තුවන ශුද්ධවත් දිවිපැවැත්ම ගැන අවධාරණය කළ දිවැසිවරයා කවු ද? කුමන රාජ්‍යයේ ජනතාවට ද? (ල. 2)

ii) දේව මාළිගාවේ දර්ශනය දුටු දිවැසිවරයා දෙවියන් වහන්සේ ගැන අවබෝධ කරගත්තේ කුමක් ද?
එය සාක්ෂාත් කිරීමට හඬ නැගුවේ කවු ද? (ල. 3)

iii) දෙවිඳුන් අදහන අය පිවිතුරු ජීවන චර්යා තුළ ජීවත්වීමට යොමුවිය යුත්තේ කෙසේ ද? එමඟින් ක්‍රියාත්මක වන ගුණාත්මක ලක්ෂණ 05 ක් ලියන්න. (ල. 5)

03. i) මාර්ගයේ වර්ධනය නිෂ්ක්‍රීය කිරීමට පියවර ගත් විරෝධියාගේ උපන්ගම, ගෝත්‍රය, ඇදහිල්ල, ආගමික අධ්‍යාපනය ලියන්න. (ල. 2)

ii) නව උපතකට පිවිසීමෙන් යොමු වූ ප්‍රබල කිතුණු සාක්ෂිකාර ධර්මදූත මෙහෙවර ඵලදායී කරගැනීමට සාවුල් තාර්සස්හි පෝෂණය ලත් විවිධ ක්ෂේත්‍ර 03 ක් ලියන්න. (ල. 3)

iii) ශුභාරංචි ව්‍යාපනය උදෙසා දෙවිඳාණෝ තෝරාගත් ආයුධයක් ලෙස සාවුල් නමැති එඩිතර ධර්මදූත ජීවිතයේ කැපී පෙනුණු කිතුණු වටිනාකම් 05 ක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

04. i) දිවැසිවර ජෝවෙල් පැවසූ අනාවැකිය ඉටු වූයේ ජුදාගමේ කුමන සැමරුම් දිනයේ ද? එදින ශ්‍රාවකයන් කුමක් කරමින් සිටියේ ද? කරුණු 02 ක් ලියන්න. (ල. 2)

ii) පේදුරුගේ දේශනය කළ ජනතාව ඇසූ ප්‍රශ්නය කුමක් ද? පේදුරුතුමා ඔවුන්ට දුන් මගපෙන්වීමට අනුව සභාවේ සාමාජිකත්වය සීඝ්‍ර ලෙස වර්ධනය වීමට හේතු 02 ක් ලියන්න. (ල. 3)

iii) 1. ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට සංකේතාත්මක ආදර්ශමත් පිළිවෙත ලියන්න.
2. එයින් ස්ථාපිත වූයේ කුමක් ද?
3. එමඟින් මුල් සභාවේ බැතිමතුන්ගේ ජීවිත චර්යාවේ ඇති වූ වෙනස ලියන්න.
4. මෙම සිහිකිරීම පැවැත්වූයේ කොහේ ද?
5. වර්තමාන කිතුණු සභා දේවස්ථානවල පවත්වන මෙ මපිළිවෙතට ඔබ සහභාගී වන්නේ මන්ද? සහභාගී විය යුත්තේ කෙසේ ද? (ල. 5)

05. i) ඇතැන්ස්හි නාඳුනන දෙවියන් වැඳුම් පිදුම් කළ ඔබ බහු ඇදහිලිවන්ත ජනතාව ඉදිරියේ සාවුල්තුමා මැවුම්කාර දෙවිඳාණෝ සමාන කළ නොහැකි බව අනාවරණය කළේ කෙසේ ද? කරුණු 02 ක් ලියන්න. (ල. 2)

ii) කොරින්තියේදී සාවුල්තුමා නවාතැන් ගත්තේ කවුරුන් සමඟ ද? සාවුල්තුමා මොවුන් හා එක්ව කළේ කුමක් ද? එපිසයට පැමිණි මෙම යුවළ දැහැමි සේවය දායක වූයේ කෙසේ ද? (ල. 3)

iii) එපිසයේ ධර්මදූත සේවයේ යෙදී සාවුල්තුමා ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය තුළ යොමු වූ ක්ෂේත්‍ර 05ක් ලියන්න. උදාහරණ සමඟ කෙටියෙන් (ල. 5)

06. i) ජුදෙව් සමාජය දරුවන්ට සැලකිලි දැක්වූයේ කෙසේ ද? කරුණු 02 ක් ලියන්න. (ල. 2)
ii) යේසුස් වහන්සේ දරුවන් උතුම් ලෙස පිළිගත් අවස්ථා 03 ක් ලියන්න. (ල. 3)
iii) ශ්‍රී ලංකාවේ විවිධ අතවරවලට මුහුණ දෙන දරුවන්ගේජීවිත නඟා සිටුවීමට ඔබ ඉදිරිපත් කරන යෝජනා 05 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

07. පහත සඳහන් මාතෘකා අතුරින් 02ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න. ජ. සඳහාදී ඇති උපදෙස් වාක්‍යය භාවිතා කරන්න.

i) පළමු ධර්මදූත චාරිකාව
- මේ සඳහා කැඳ වූ පුද්ගලයන්
- සේවය තුළ ලැබූ අත්දැකීම්
- හවුල් නායකත්වයේ ඇති වැදගත්කම
- ආපසු එන ගමනේ පැවති උද්යෝගී බව
- ධර්මදූත ගමනෙන් ලද හැකි ආදර්ශ

ii) පවුලේ නිර්මාතෘ දෙවියන් වහන්සේ
- පවුල පිළිබඳ බයිබලයේ දැක්ම
- කිතුණු පවුලේ යුතුකම් හා වගකීම්
- කිතුණුවෙකු තුළ තිබිය යුතු ජීවිත ප්‍රතිපත්ති
- වර්තමාන සමාජයට කිතුණු පවුලකින් ගතහැකි ආදර්ශ

iii) ආමොස්
- සේවය කළ පසුබිම
- ඉදිරිපත් කළ දිවැස් වැකිවල අර්ථවත් බව
- පණිවිඩය තුළින් අපගේ ජීවිතවලට ගතහැකි ආදර්ශ
- එතුමා දුටු සමාජ අසාධාරණයෙන් හා ඒවා ඉදිරියේ කළයුතු ආකාරය
- අසාධාරණය ඉදිරියේ කිතුණු අපගේ වගකීම

iv) මුල් කිතුණු සභාව
- මුල් කිතුණු සභාවේ ආරම්භය
- මුල් සභාව දියත් කළ සේවාවන් (මෙහෙවර)
- මුල් සභාව මුහුණ දුන් ගැටලු
- ඒවා විසඳීමට ගත් ක්‍රියා මාර්ග
- සුභසාධන කටයුතුවලින් වර්තමාන කිතුණුවාට ලද හැකි ආදර්ශ

(ලකුණු 2 x 5 = 10)

**අවසන් වාර පරීක්ෂණ - 2022**

**පිළිතුරු පත්‍රය - 11 ශ්‍රේණිය**

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01) | III | 11) | II | 21) | III | 31) | I |
| 02) | IV | 12) | III | 22) | IV | 32) | III |
| 03) | I | 13) | IV | 23) | II | 33) | I |
| 04) | III | 14) | III | 24) | III | 34 ) | III |
| 05) | II | 15) | III | 25) | IV | 35) | I |
| 06) | I | 16) | I | 26) | III | 36) | I |
| 07) | IV | 17) | III | 27) | III | 37) | II |
| 08) | IV | 18) | IV | 28) | IV | 38) | III |
| 09) | III | 19)II | | 29) | I | 39) | I |
| 10) | I | 20)IV | | 30) | III | 40) | IV |

## II කොටස

01. I . ආබ්‍රහම්, ජාතීන්ගේ පියා
    II. නෙල්සන් මැන්ඩෙලා මහතා,මයිකල් රුද්‍රිගු පියතුමා
    III. නපුරාගෙන් එල්ල වන සියලු වේදනා තුළ දී පවා දෙවියන් වහන්සේට ළඟා විම තුල උන්වහන්සේගේ ප්‍රේමය අත්විදීමට හැකි වන බව.
    IV. ඔබ :- ස්මාරිත ස්ත්‍රිය  මම :- ජේසුස් වහන්සේ
    V. රෝම අධිරාජ්‍යයාට ගෙවු බද්ද - සීසර්ගේ රූපයේ මුද්‍රිත කාසි
    දේව මාළිගාවේ නඩත්තුව සඳහා ගෙවු බද්ද - තඹ කාසි
    VI. සැඩ සුළඟක් වැනි හඬ, ගිණි දලු වැනි දිව් එකිනෙකා මත පිහිටීම
    VII. තම සතු සියල්ල පොදුවේ තබා ගැනීම./ තමා සතු දේපල විකුණා අවශ්‍යතා අනුව බෙදා ගැනීම.
    VIII. මඟ පෙන්වීම, තෘෂ්ණාවන්ට වන්නේ, මාංශික
    IX. ගෙයින් ගෙට ගොස් ස්ත්‍රීන් හා පුරුෂයින් සිරභාරයට ගැනීම
    X. ආමෝස් දිවැසිවරයා / ජුදෙව් ජනතාව

02) I. යෙසායා දිවැසිවරයා - දකුණු දිග රාජ්‍යයට
    II. දෙවියන් වහන්සේගේ ශුවිශුද්ධ බව. දෙවියන්ගේ සිහසුන සිසාරා සිටි සෙරාප්වරු පියාසර කරමින් තෙවරක් දෙවිදුන්ගේ ශුවිශුද්ධ බව, එක්කෙනෙකුට අනෙකුට හඬනගා පැවසීම.
    III. පාපයේ බරපතලකම අවබෝධ කර ගැනීම ආදි සිසු අදහස් වලට ලකුණු ලබා දෙන්න.

03) I. සිලිසියාවේ අගනගරය වූ තාර්සස්, බෙන්ජමින්ගේ ගෝත්‍රය, ඒක දේව ඇදහිල්ල, ගමැලියෙල් යටතේ ජුදා ආගම්වල ව්‍යවස්ථාව ඉගෙනීම.

II. විවිධ ජාතීන් ඇසුරු කිරීමත් ඔවුන්ගේ සංස්කෘතීන් පිළිබඳ අවබෝධය ග්‍රීක දාර්ශනවාදීන් ඇසුරු කිරීම. තාර්ශස් හි විශ්ව විද්‍යාල අධ්‍යාපනය, රෝම පුරවැසිභාවය

III. සිසු අදහස් වලට ලකුණු ලබා දෙන්න

04) I. පෙන්තකොස්ත මංගල්‍යය දින / ජෙරුසෙලමේ උඩුමහලක රැස්වී යාච්ඤාවේ නිරතව සිටීම.

II. අපි කුමක් කරමුද?
ශුංභාරංචිය අවබෝධ කරගෙන පේදුරුතුමා දුන් මඟ පෙන්වීම විශ්වාසයෙන් පිළිගැනීම, මනස්ථාපනය වී බෞතීස්මයෙන් සභාවට ඇතුළු වීම.

III. ★ රොටි හා මිදියුෂ ගෙන තුති පුදා කඩා ශ්‍රාවකයන්ට බෙදා දීම.
★ ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිත පූජාවෙන් ස්ථාපිත කළ නව ගිවිසුම
★ සමානාත්මතාව, සහයෝගය, සහභාගිකම
★ බැතිමතුන්ගේ නිවෙස්වල/ ගෙයින් ගෙට ගොස්
★ සිසු අදහස් වලට ලකුණු දෙන්න

05) I. මිනිස් කලා ශිල්පයෙන් හා දක්ෂකමින් කැටයම් කළ රනටවත්, රිදීයටවත්, ගලටවත්, රූපවලටවත්

II. අකිලා ප්‍රිස්කිලා/ කූඩාරම් කර්මාන්තය/ අපොල්ලොස් නම් ධර්මදේශකයාට, දෙවියන් වහන්සේගේ මාර්ගය වඩා නිවැරදි ලෙස පහදා දීම.

III.
- බෞතීස්මය - ස්නාවක ජොහාන්ගේ බෞතීස්මය දැන සිටි ශ්‍රාවකයන් 12 දෙනා
- දේශනා කිරීම - ධර්මශාලාවල රැස්වූ ජනතාවට
- ඉගැන්වීම - කුරානස්ගේ ශිල්ප ශාලාවේ දිනපතාම
- සුව කිරීම - කායික රෝගවලින් සුව කිරීම
- නපුරු ආත්ම දුරු කිරීම - ජේසුස් වහන්සේගේ නාමයෙන් සුවය

06) I. දරුවා අගය කිරීම, අයිතිවාසිකම්වලට හිමිකම් ඇති බව

II. ★ දරුවන් දේව දායාදයක් ලෙස පිළිගෙන ආශිර්වාද කළ බව
★ දරුවෙක් ලෙස ජීවිත ගොඩ නැගුවේ නැත්නම් දේව රාජ්‍යය හිමකම් නොලැබෙන බව
★ බෙල්ලේ ඇඹරුම් ගලක් එල්ලා දියේ ගිල්වීම යහපත් බව

III. දරුවාගේ පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න

07) I. පළමු ධර්මදූත චාරිකාව
❖ පාවුල්, බාර්ණබස් හා ජොහාන් නම් ලත් මාර්ක්
❖ සිලුකිය සිරියාවෙන් අන්තියෝකියේ වරායෙන් නැව් නැගීම
❖ සර්ගියස්, පාවුලස් නමැති බුද්ධිමත් රෝම දේශාධිපතියා සමඟ හවුලේ ක්‍රියා කිරීම. එලිමස් මැගෝස් නම් ඉන්ද්‍රජාලිකයා මුණ ගැසීම. ජොහාන් මාර්ක් ආපසු හැරී යාම.
❖ වගකීම් දැරීම, දේව වචනය දේශනා කිරීම
❖ දේශන කිරීම හා එයට ආරාධනා ලැබීම
❖ ශ්‍රාවකයන් දිරිමත් කිරීම
❖ ඇදහිල්ලේ ස්ථිරව සිටීම
❖ අභියෝග මැද වුව ද දෙවියන් වහන්සේගේ මඟ පෙන්වීම ලැබෙන බව
❖ සාමුහික හැඟීමෙන් කටයුතු කිරීමෙන් අභියෝග ජය ගත හැකි බව

- ❖ කණ්ඩායමක් ලෙස වගකීම් දරන විට තම අත්දැකීම් නැවත සමාලෝචනය කිරීමේ වගකීම් දැරීමට හැකි වීම

II. පවුලේ නිර්මාතෘ දෙවියන් වහන්සේ
- ❖ ආරම්භයේ සිටම දෙවියන් වහන්සේ මිනිසා මැවීම ආදම් /ඒව
- ❖ සාමුහික ජීවිතය් දේව කැමැත්ත බව
- ❖ භාර්යාවගේ හා පුරුෂයාගේ වගකීම
- ❖ එකිනෙකාට කමා කිරීම
- ❖ සියල්ලේ දී ස්වාමින් වහන්සේට ස්තුති කිරීම
- ❖ ප්‍රේමයෙන් කටයුතු කිරීම
- ❖ දරුවාගේ අදහස් වලට ලකුණු දෙන්න

III. ආමෝස්
- ❖ තෙකෝවා ගම්වැසියෙක් / බැටළු එඬේරෙක්
- ❖ ආමෝස් 4,5 පරිච්ඡේද බලන්න

IV. මුල් කිතුණු සභාව
- ❖ ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් දින පනහකට පසුව පෙන්තකොස්ත මංගල්‍යය
- ❖ ශුද්ධාත්ම දානය
- ❖ ශුද්ධාත්ම බලය තුළ ජ්වලිතකම
- ❖ 300 පමණ සෙනඟ බව්තිස්ම ලැබීම/ සභාවට එකතු වීම
- ❖ නමස්කාර ජීවිතයේ නියැලීම
- ❖ ධර්මධාන මෙහෙවර ඉටු කිරීම
- ❖ සහනාධාර ලබා දීමේ ගැටළුව
- ❖ උපස්ථාදායකින් පත් කිරීම
- ❖ සාකච්ඡාවෙන් විසඳුම් සෙවීම
- ❖ යාච්ඤාවෙන් දේව මඟ පෙන්වීම ලබා ගැනීම
- ❖ සභාවේ අභිවෘද්ධිය සඳහා යෙදවීම
- ❖ සමානාත්මතාවය උසස් කොට සැලකීම
  (පෙළ පොතේ 37 වෙනි පිටුව)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න